22100267

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Thursday 13 May 2010 (afternoon)
Jeudi 13 mai 2010 (après-midi)
Jueves 13 de mayo de 2010 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.



© International Baccalaureate Organization 2010

**පහත දැක්වෙන ජේද අතුරෙන් එකක් සඳහා විවරණයක් සපයන්න.**

**1.**

හඳයා, උපාලිස්ගේ කකුල ලෙව කෑවේ ය. නින්දෙන් අවදිවුණු ඔහු පළමුව තම දෙපා දෙස බැලුවේ කෝපයෙනි. ඌ යළිත් ඔහුගේ කකුල ලෙව කෑවේ ය. කඳුලෙන් තෙත් වුණු මහල්ලකුගේ දෙඇස සිහිකරවන උගේ දෙ ඇසත් තමා දෙසට හරවන ලද සැලෙන මස්පිඬු සහිත හොම්බත් දුටු උපාලිස්ගේ කෝපය මැඩගෙන නඟින්නේ කාරුණික හැඟීමකි.

"වරෙන් - වරෙන් - මෙහාට වරෙන් ......" යි ඔහු සෙමින් කීවේ ය.

හඳයා තම ඉස්සරහ ගාත් දෙකින් එකක් සෙමින් ගෙපිළෙහි තැබුවේ ය; අනතුරුව අනික් ගාතය ද ඉතා අමාරුවෙන් පස්සා ගාතය ද උස්සා ගෙපිළෙහි තැබුවේ ය. ඌ අනික් පස්සා ගාතය ද තබා ගෙපිළට නැඟුණේ කන්දකට නඟින්නකු මෙන් මහන්සි වීමෙනි.

උපාලිස් තමා වෙතට ළංවූ ගොන් මාල්ලාගේ මුහුණ අතගෑවේ ය. ඌ තම ස්වාමියාගේ හිසත් අතත් ලෙව කෑවේ ය. බඳින ලද ගැටයකින් එක් කරන ලද දළ කෙස් වැටිය තෙල් ගා පිරනු ලැබූ කලක මෙන් ඔහුගේ හිස බදාගත්තේ ය.

"ඉතින් ඇති ..........."

හඳයා යළිත් උපාලිස්ගේ පිටිඅල්ල ලෙව කා අනතුරුව ගෙහි උළුවස්ස දෙස බැලුවේය.

දොර ඇරගෙන බරාඳයට පැමිණි උපාලිස්ගේ බිරිඳ,

"බැහැපන් - බැහැපන් මිදුලට" කියමින් හඳයාගේ හිසට අත ගසා ඌ තල්ලු කළා ය. කීකරු දරුවකු මෙන් ඌ ආපසු හැරී මිදුලට බැස උපාලිස්ගේ ඇඳ දෙස මඳ වේලාවක් බලා සිට ගමන් කෙළේ ය.

ඌ මඳක් තැන් ගොස් හිස පස්සට හරවා ගස්සා 'කිස්' හඬින් වල්ගය ගැසුවේ ය. උගේ කොන්දෙහි හා පිටෙහි ඇලී සිටි කෝදුරුවෝ, සුළඟින් නඟන ලද දූවිලි කඩක් මෙන් නැංගේ ය. "හඳයා මෙයාට නිදාගන්නවත් දෙන්නේ නැහැ; හැමදාම උදේ ඇවිත් අවදිකරනවා"යි බිරිඳ කීවා ය.

"දැන් වේලාව කීයට විතර ඇද්ද?"

"තාම කපුටන් හඬනවා. දැන් හයට විතර ඇති" යි කියමින් බිරිඳ වටපිට බැලුවා ය. නියන් කොබෙයියකු 'ක්කුවෝ - ක්කුවෝ' යි නඟන හඬ ඈට ඇසෙයි. දෙතුන් වර්ගයක නළා හඬවන නළා කාරයන් මෙන් කුරුල්ලන් කිහිප දෙනකුන් නඟන මිහිරි හඬ ද ඈට ඇසෙයි.

"හඳයා හැමදාම උදේ ඇවිත් මෙයාගේ කකුල ලෙව කාලා මෙයා අවදි කරනවා. ඌ කාටවත් විකුණාදාන්න ඕනෑ ........... "

"නෑ - නෑ - ඌ විකුණන්නේ නෑ" යි උපාලිස් කී ය.

තම ජීවිතය හඳයාගේ ජීවිතය හා අත්වැල් බැඳගත්තක් බව උපාලිස් දනියි. කරත්ත කාරයකු ලෙස ජීවත් වූ ඔහු, දෙවන වර මිලට ගත් හරකා හඳයා වෙයි. දරුවන් දෙදෙනෙකුන් හා තම බිරිඳ ද සමඟ යන්තම් කා බී ජීවත් වීමට ඔහුට උදව් කෙළේ හඳයා ය.

උපාලිස් සුරතල් කෙළේ තමාගේ දරුවන් සමඟ නොව හඳයා සමඟ ය. මසකට වරක් තෙල් ගා පිසදමනු ලබන උගේ ඇඟෙහි කිනිතුල්ලෝ බෝ නොවූහ. උගේ ඇඟෙහි ඇට මැස්සකු සිටිනු දුටු විට ඔහු, බැඳි වැදුණු මුවකු හඹන වැද්දකු මෙන් ඌ සෙව් ය. දරුවකු හදන මවක මෙන් හඳයාට සාත්තු කළ ඔහු ඌට කිසි කලක නොතැළුවේ ය.

මාර්ටින් වික්‍රමසිංහ, වහල්ලු, 1951

- **මෙම කොටස කෙබඳු අවස්ථාවක් නිරූපණය කරන්නක්ද. එමගින් කවර අන්දමේ පසුබිමක් ඉදිරිපත් වෙයිද?**
- **මෙහි දැක්වෙන පරිදි, මිනිසා සහ තිරිසනා අතර දැඩි බැඳීමක් මතු කර පෙන්වීමට කතුවරයා කොතෙක් දුරට සමත් වී ඇද්ද?**
- **උපාලිස් සහ ඔහුගේ බිරිඳ හඳයා කෙරෙහි දක්වන ආකල්පවල වෙනස පැහැදිලි කරන්න.**
- **මෙම අවස්ථාව ප්‍රබල ලෙස නිරූපණය කිරීමට මෙහි යොදාගෙන ඇති බස් වහර කොතෙක් දුරට උපකාරී වී ඇතැයි කිව හැකිද?**

**2.**

# ධීවරි ගීතය

හිමි ඔබ සයුර මැද රුදු සටනකය    රැයේ
පොල් අතු පැලේ මම තනියම වෙසෙමි    බියේ
ඇතිමුත් හුරු පුරුදු එඩිතර ගතිය    ළයේ
තරමක සැකයකිනි ඔබ අද සවස    ගියේ

අහසේ අඳුරු පැහැ වැහිකළු නගින    කොට
සුළඟේ වෙනස මෙහි ගහ කොළ කියන    කොට
ගෙරවිලි සහිත විදුලිය හඬ ඇසෙන    කොට
හිමියනි මගේ හිත වාවනු බැරිය    මට

හබලට ඔබේ සවිබල අත    රිදෙනවද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ    නගිනවද
සීතල සුළඟ රළුවට ඇඟ    වැදෙනවද
හිමියනි වෙහෙස නිදිමත දෙක    දැනෙනවද

ගොඩ බිම කොහෙද නැති මහ මුහුදෙහි    අෑත
හිමි ඇත වෙහෙසමින් වෙහෙසී ඇති    දෑත
ඔබ නැති නිසා හිමියනි මේ ලඟ    පාත
සුළඟේ මැකී යයි මගෙ දුක්මුසු    ගීත

එළියක් පෙනෙන විට හිමියනි වෙරළ    බඩ
නැතහොත් දැනෙන විට ඔරුවක් ඇදෙන    හඬ
දෙ සවන වැටෙන විට කිසිවෙකු නගන    හඬ
මා නොදැනුවත් ව ම මම මගෙ දෙ පය    උඩ

වැහිපොද මගෙ හිමිගෙ හිසමත    නොවැටේවා
මේ රුදු සුළං රැළි රැළ පිට නො    ගැටේවා
පැද යන ඔරුව වෙත මසු කැළ    දැවටේවා
ලන ඇම ගිලින තරමට උන්    රැවටේවා

ඔබ මහමුහුද මැද තනියම වෙසෙන    කල
සිහියට නැඟෙනු ඇත මෙහි මා නිදන    පැල
හිමියනි ඔබට මගෙ හදවත මිහිරි    කළ
සැනසුම තිබේ මේ පොල් අතු කුටිය    තුළ

(කේයස්) - නූතන කාව්‍ය සංහිතා, 1995

– මෙම කවි පෙළට ප්‍රධාන තේමාව වී ඇත්තේ කුමක්ද?

– කාන්තා සිතක පහළ වන හැඟිම් ඉස්මතු වන සේ කාව්‍යමය යෙදුම් ගළපාගැනීමට කවියා කොතෙක් දුරට සමත් වී ඇද්ද?

– මෙම කවි පෙළ පුරාම මතු වන ළයාන්විත රිද්මය පාඨක සිත් ඇද බැඳගැනීමට කොතරම් දුරට සමත් වෙයිද?

– අවස්ථාවට ගැළපෙන පරිසරයක් මැවීම සඳහා යෝග්‍ය වන පරිදි කාව්‍යමය භාෂාවක් මෙහි යොදාගෙන ඇද්ද?